Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

**අකුරැස්ස ප්‍රාදේශීය සභාව**

අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *මාසික වැටුප් පරිමාණය* | *අවම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද* | *පොදු සුදුසුකම්* |
|---|---|---|---|---|
| වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 02 | රා.ප.ච. 3/2016 අනුව PL1 - 2016 වැටුප් කාණ්ඩයෙහි 2017 වර්ෂයට අදළ ආරම්භක පියවර | 8 වන ශ්‍රේණිය (09 වසර) සමත්ව තිබීම. | ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතුය. විශිෂ්ට චරිතයකින් යුක්තවිය යුතුය. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03 ක් දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.<br><br>පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද සහතිකය මත අදළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර, නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතුය.<br><br>තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.<br><br>සෑම අපේක්ෂකයකුම දකුණු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය. |

*වෙනත් :*

1. අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ දැනට ස්ථිර/අනියම්/ආදේශක/තාවකාලික/කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවකයින් සඳහා සහ සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.
2. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය. (දැනට ස්ථිර සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)
3. අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතුය.
4. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

1. සම්මුඛ පරීක්ෂණයකින් පසුව තෝරා ගනු ලැබේ;
2. නියමිත සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථිරය;
2. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය, රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් වේ;
3. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වන අතර, වසර තුන (03) අවසානයේ වැඩ, පැමිණීම හා හැසිරීම යහපත් තත්වයේ සිටින සේවකයින්ට පමණක් ස්ථිර පත්වීම් ප්‍රදානය කරනු ලැබේ;

4. මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තු නියෝග වලට ද, රජයේ හෝ දකුණු පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝග වලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතුය.

*ඉල්ලුම් කරන ආකාරය :*

අයදුම්කරු මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරන ලද අයදුම්පත් 2017.11.27 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, අකුරැස්ස ප්‍රාදේශීය සභාව, අකුරැස්ස" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් ඇමිණිය යුතු අතර, මුල් පිටපත සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

1. උප්පැන්න සහතිකය ;
2. අධ්‍යාපන සහතිකය ;
3. පදිංචිය සහතික කිරීම පිණිස මෑතකදී ලබා ගත් ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර තිබිය යුතුය.) ;
4. මෑතකදී ලබා ගත් චරිත සහතිකර 02 ක් ;
5. පළපුරුද්ද පිළිබඳ සහතික ;
6. අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් සේවා සහතිකයක්.

එම්. ඒ. ගාමිණී ජයරත්න,
ලේකම්,
අකුරැස්ස ප්‍රාදේශීය සභාව.

2017 ක් වූ ඔක්තෝබර් මස 11 වැනි දින,
අකුරැස්ස ප්‍රාදේශීය සභාව, අකුරැස්ස.

## වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුර සඳහා අයදුම්පත

1. අයදුම්කරුගේ නම (මුලකුරු සමග නම) :- ....................................................
2. මුලකුරු වලින් හැඳින්වෙන නම් :- ....................................................
3. ස්ථිර පදිංචි ලිපිනය :- ....................................................
4. දුරකතන අංකය :- ......................................................
5. දිස්ත්‍රික්කය :- ......................................................
6. උපන් දිනය :- වර්ෂය :.......... මාසය :............ දිනය :.......
7. ජාතික හැඳුනුම්පත් අංකය :-.......................................................
8. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :- අවුරුදු :.......... මාස :.............. දින :.......
9. ස්ත්‍රී/ පුරුෂ භාවය :- ......................................................
10. විවාහක/ අවිවාහක බව :- .......................................................
11. ජාතිය :- ........................................................
12. ශ්‍රී ලංකා පුරවැසියෙක් ද යන වග (එසේ නම් පරම්පරාවෙන් ද/ලියාපදිංචි වීමෙන් ද?) :.....................................................
13. අධ්‍යාපන සුදුසුකම් :

| *විෂය* | *සාමාර්ථය* | *විෂය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

14. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :- .........................................................
15. සාපරාධී වරදක් සම්බන්ධයෙන් අධිකරණයක වරදකරුවෙකු වී ඇද්ද :- .........................................................

16. ඔබ දැනටමත් අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම්,

- දැනට දරන තනතුර :- ....................................................
- එම තනතුරට පත් වූ දිනය :- ..................................................
- එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත ද) :- ..............................................

මම අයදුම්පතේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත්, ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත්, මා නුසුදුස්සෙකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත්, කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දන්වමි.

දිනය :................................ ........................................,

අයදුම්කරුගේ අත්සන.

දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය.

මෙම ඉල්ලුම්කරු වන ................................................................................ මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම කාර්යාලයේ .............. ................................................................. වශයෙන් සේවය කරයි. අයදුම්පත නිර්දේශ කර/නිර්දේශ නොකර ඉදිරිපත් කරමි.

දිනය :........................................ ..................................................,

ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)